# ලේඛක අත්වැල -2021

ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම යනු අනාදිමත් කාලයක් එම ග්‍රන්ථය පරිශීලනය කරනු ලබන පාඨක පිරිසකට මෙන්ම එහි ඇතුලාන්තයෙන් බුද්ධිමය වපසරිය පෝෂණය කරගනු ලබන පිරිසකට ඒ සඳහා ලැබෙන අත්වැලක් බව දැක්වීමට පුළුවන. මධ්‍යම පළාත තුළ විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ග්‍රන්ථකරණයේ නිරත වන ලේඛකයින් විශාල පිරිසක් සිටින අතර බොහෝ වෙහෙස මහන්සියෙන් ඔවුන් විසින් මුද්‍රණය කරනු ලබන ග්‍රන්ථ අලෙවි කරගැනීමට ද ඒ හා සමාන වෙහෙසක් දැරීමට සිදුවීම කනගාටුවට කරුණකි.

එම තත්වය යම් ප්‍රමාණයකට හෝ සමනය කිරීමට මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචි ග්‍රන්ථකරණයේ නිරත වන ලේඛකයින් විසින් මුද්‍රණය කරනු ලබන ග්‍රන්ථ මිලදී ගැනීම අරමුණු කරගෙන ගෙන මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් මෙම ලේඛක අත්වැල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

ඒ මඟින් - සිය කාලය,ධනය,හා ශ්‍රමය කැප කර, සබුද්ධික පාඨක පිරිසකට බුද්ධිමය නිම් වළලු පුලුල් කර ගැනීමට මෙවලම් සපයමින් ග්‍රන්ථකරණයේ නියැලි සිටින ලේඛක පිරිසට ඒ සඳහා අත්වැලක් වීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

එසේම -

01. ග්‍රන්ථකරණයට ඇල්මක් ඇති ආධුනික ලේඛක ලේඛිකාවන් සඳහා ශක්තියක් වීම.
02. ග්‍රන්ථකරණය සඳහා නව ලේඛක ලේඛිකාවන් පෙළඹවීම.
03. සමාජයෙන් දුරස්ථ වී යන අස්පර්ෂණීය / ස්පර්ෂණීය උරුමය ලේඛනගත වීම.
04. සමාජ ප්‍රපංචයන් දෙස නව මානයකින් බැලීමට අවස්තාව උදාවීම.
05. විවිධ විෂය කරුණු මත ග්‍රන්ථකරණය වීම හේතුවෙන් පාඨක අවශ්‍යතා සපුරාලීමට හැකිවීම.
06. කියවීමෙන් ඈත්වී සිටින දරුවන් කියවීමට පෙළඹවීම. ලෙස තවත් කරුණු ගණනාවක් සපුරාගැනීමට මේ මඟින් අවස්ථාව උදාවේ.

ක්‍රම වේදය -

01. මධ්‍යම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මේ සඳහා ප්‍රචාරයක් ලබාදීම.
02. දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය මඟින් ප්‍රචාරයක් ලබාදීම.
03. අයදුම්පත්‍ර සමඟ ග්‍රන්ථ ලබාගැනීම.
04. ප්‍රමාණික වියත් සමීක්ෂණ මණ්ඩලයක් මඟින් සමීක්ෂණයට ලක්කිරීම.
05. සමීක්ෂණ මණ්ඩල ප්‍රමුඛතා නිර්දේශ මත මිල දී ගන්නා ග්‍රන්ථ තීරණය කිරීම.
06. තෝරාගනු ලබන ග්‍රන්ථ ලේඛකයින්ගෙන් ලබාගැනීම.

කොන්දේසි -

01. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
02. කෘතියෙහි ප්‍රථම මුද්‍රණය විය යුතුය.
03. මෙම ව්‍යාපෘතිය යටතේ මෙයට පෙර මිළදී ගත් ග්‍රන්ථයක් නොවිය යුතුය.
04. රාජ්‍ය අනුග්‍රහය යටතේ මුද්‍රණය කළ ග්‍රන්ථයක් නොවිය යුතුය.
05. මධ්‍යම පළාතේ අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක අනුග්‍රහාත්මක වැඩ සටහනකට ඉදිරිපත් නොකරන ලද ග්‍රන්ථයක් විය යුතුය.
06. නව කතා /කෙටි කතා / ළමා කතා / පද්‍ය කෘති / පරිවර්තන / අනුවර්තන / සාහිත්‍ය කෘති / හා සංස්කෘතික විෂය ක්ෂේත්‍රයට අදාල හා පාසල් විෂය මාලාවට අනුමත සංස්කෘතික හා සාහිත්‍ය කෘති විය යුතුය.

07. ව්‍යාකරණ, අක්ෂර වින්‍යාසය නිවැරදි සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය කෘති පමණක් විය යුතුය.
08. ISBN අංකය ලබා ගත්, ග්‍රන්ථය මිළට ගනු ලබන 2021 ජුනි 30 දිනට වසර තුනකට පූර්ව කාලය තුළ මුද්‍රණය කළ ග්‍රන්ථයක් විය යුතුය.
09. අයදුම්පත්‍රය සමඟ සමීක්ෂණයට ඉදිරිපත් කරනු ලබන කෘතියේ / කෘතිවල පිටපතක් මෙම දෙපාර්තමේන්තුවට ලැබෙන්නට සැලැස්විය යුතුය.
10. සමීක්ෂණ මණ්ඩලය මඟින් මිළට ගැනීමට තීරණය වූ ග්‍රන්ථය මෙම දෙපාර්තමේන්තුවේ පුස්තකාලයට ගනු ලබන අතර සමීක්ෂණ මණ්ඩලය මගින් ප්‍රතික්ශේප වූ ග්‍රන්ථ අයදුම්කරුට ආපසු ලබාගැනීමට අවස්ථාව ඇත.
11. ග්‍රන්ථයේ මුද්‍රිත මිලෙන් 20% ක වට්ටමකට යටත්ව සමීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ග්‍රන්ථ ප්‍රමාණ (සමීක්ෂණයට ලබා දුන් ග්‍රන්ථය හැර )දෙපාර්තමේන්තුව විසින් දන්වා එවනු ලබන දිනයට ගෙනවිත් බාරදිය යුතුය.
12. අයදුම්පත් බාරගන්නා අවසන් දිනය 2021.06.30 වේ.

අයදුම්පත් ලබාගැනීම -

01. ඔබගේ ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරි මඟින්.
02. www.culture.cp.gov.lk වෙබ් අඩවිය මඟින්ද ලබාගත හැකිය.
03. මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මඟින්ද ලබාගත හැකිය.

අයදුම්පත් යොමු කිරීම -

01. පළාත් අධ්‍යක්ෂ,සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,යටිනුවර වීදිය, මහනුවර.ලිපිනයට හෝ
02. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පළාත් සංස්කෘතික නිලධාරි වෙත බාරදීමෙන් හෝ
03. මෙම දෙපාර්තමේන්තුවට ගෙනවිත් බාරදීමෙන්.

වැඩිදුර විස්තර සඳහා -

01. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරි මඟින්
02. පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව.යටිනුවර වීදිය මහනුවර මඟින්
03. 081 - 2238476 දුරකථන අංකය මඟින් හෝ www.culture.cp.gov.lk වෙබ් අඩවිය මඟින් ලබාගත හැකිය.

මෙම කෘති තෝරාගැනීම සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයේ තීරණය හා පළාත් අධ්‍යක්ෂගේ තීරණය අවසන් තීරණය වේ.

ස්වර්ණා පෙරේරා,
පළාත් අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
මහනුවර.

## ලේඛකයින් දිරි ගැන්වීම සඳහා ක්‍රියාත්මක කර ඇති ලේඛක අත්වැල ව්‍යාපෘතිය යටතේ

## පොත් මිලදී ගැනීම - 2021

01. ග්‍රන්ථ කතෘගේ සම්පූර්ණ නම –:..........

02. පොත් මිලදී ගත හොත් චෙක්පතේ සඳහන් කළ යුතු නම–:..........
(චෙක්පත් මගින් ගෙවීම් කරන හෙයින් බැංකු ගිණුමේ සඳහන් පරිදිම විය යුතුය.)

03. ග්‍රන්ථ කතෘ වෙත ලබා දෙන සහතික පත්‍රයේ ඇතුලත් විය යුතු නම–:..........

04. පෞද්ගලික ලිපිනය –:..........

05. රාජකාරි ලිපිනය –:..........

06. දුරකථන අංකය.–:පෞද්ගලික .......... රාජකාරි. ..........

07. ඊ මේල් ලිපිනය–:..........

08. පදිංචි දිස්ත්‍රික්කය–:..........ප්‍රා:ලේ: කොට්ඨාශය.–.:..........

09. මිලදී ගැනීම සලකා බැලීම සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත කෘතිවල නම්–:..........

..........

10. මාධ්‍ය–:( සිංහල / ඉංග්‍රීසි ..........

11. කෘතියේ වර්ගය (කෙටිකතා/නවකතා/ළමා කතා/නාට්‍ය/ඉතිහාස/ඓතිහාසික/විචාර/පරිවර්තන/සංස්කෘතික විෂය ක්ෂෙත්‍ර ආදි ලෙසින්)..........

12. ලේඛකයකු වශයෙන් පළකරන ලද වෙනත් කෘති ඇතොත් ඒ පිළිබඳ විස්තර–:..........

..........

13. පාසල්වල භාවිතය සඳහා සුදුසු බවට නිර්දේශ කර ඇද්ද? එසේනම් කවුරුන් විසින්ද? යනවග–: ..........

..........

14. ඔබගේ කෘතිය සඳහා ලබා දී ඇති ISBN අංකය –:..........

15. කෘතිය පිළිබඳ පුවත්පත් මගින් හෝ විචේචකයින් මගින් විචේචනය කර ඇත්නම් ඒවායේ(පිටපත් අමුණන්න) ..........

16. මෙම කෘති මිලදී ගෙන ඇති රාජ්‍ය ආයතන හා පිටපත් ප්‍රමාණය (කරුණාකර ඇණවුම් පිටපත් අමුණන්න)

17. මීට පෙර මෙම ව්‍යාපෘතිය යටතේ කෘති මිලදීගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර–:..........

18. පිටපතක අලෙවි මිල රු –: .......... ..........

19. දෙපාර්තමේන්තුව විසින් මිලදී ගනු ලබන පොත් සඳහා ගෙවනු ලබන්නේ අදාල කෘතියේ වටිනාකමින් 80% පමණි එයට ඔබ එකඟ වන්නේද?..........

20. පොත් මිලදී ගන්නා ලෙස ඉල්ලා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පතක් සමගම අදාල කෘතියේ පිටපත බැගින් ඉදිරිපත් කළ යුතුය. (අදාල කෘතිය තෝරාගනු ලැබුවේ නම් එය දෙපාර්තමේන්තුවේ පුස්තකාලය සඳහා ගනු ලැබේ.)

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය.–:.......... ..........
කතෘගේ අත්සන

දිනය–:.......... ..........
සංස්කෘතික නිලධාරියාගේ අත්සන